# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2010
### 2011 අප්‍රේල් / මැයි

### සමාජීය විද්‍යා පීඨය

### සංචාරණය හා සංස්කෘතික සම්පත් කළමනාකරණය - TCRM - E 1025

### සංචාරණයේ ඉතිහාසය

**<u>ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.</u>**

ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි. කාලය : පැය 03 යි.

---

01. ශ්‍රී ලංකාවේ සංස්කෘතික සංචාරණයේ ඉතිහාසය සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කරන්න.

02. ''සංස්කෘතික සංචාරණය පැරණි ඉන්දියාව තුළ පුළුල් වශයෙන් ක්‍රියාත්මක වූ බව පුරාවිද්‍යාත්මක හා සාහිත්‍යමය මූලාශ්‍රවලින් අනාවරණය වේ.'' මෙම ප්‍රකාශය තහවුරු කරමින් කරුණු ඉදිරිපත් කරන්න.

03. මිසර, ග්‍රීක හා රෝම යනාදී මධ්‍යධරණී ප්‍රදේශයේ පැවති පැරණි ශිෂ්ටාචාරයන්හි සංචාරණ කටයුතු පිළිබඳව ප්‍රමාණවත් විස්තරයක් සපයන්න.

04. i. පසුගිය දශක කිහිපය තුළ ජාත්‍යන්තර සංචාරණයේ අපගමනයන් කෙරෙහි බලපෑ කරුණු මොනවාද?

    ii. ඒවා සංචාරක ව්‍යාපාරය කෙරෙහි ඇතිකළ බලපෑම සාකච්ඡා කරන්න.

05. ''ක්‍රි. ව. 18 වන සියවසේ සිට ලෝකය තුළ ඇතිවූ සමාජ, ආර්ථික හා තාක්ෂණික වෙනස්වීම් නූතන සංචාරක කර්මාන්තයේ විකසනය කෙරෙහි හේතුකාරක විය.'' මෙම ප්‍රකාශයේ සත්‍ය අසත්‍යතාවය පරීක්ෂා කරන්න.

06. පාරිසරික සංචාරණයේ ආරම්භය හා වර්ධනය පිළිබඳව සාකච්ඡා කරන්න.

07. i. ශ්‍රී ලංකාවේ නූතන සංචාරක ව්‍යාපාරයේ ආරම්භය හා විකසනය කෙටියෙන් පැහැදිලි කරන්න.

    ii. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය හා සම්බන්ධ ප්‍රධාන කාර්යභාරය විස්තර කරන්න.

08. "යටත් විජිත සමයේ මෙරට සේවය කළ යුරෝපීය ජාතිකයෝ ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල සංචාරය කර ඉතා වැදගත් සංචාරක වාර්තා ලියා තැබූහ. " මෙම ප්‍රකාශය තහවුරු කරන්න.

පහත සඳහන් මාතෘකාවලින් එකක් පිළිබඳව ප්‍රමාණවත් පැවරුමක් සකස් කරන්න.

1. මහා පරිමාණ සංචාරණයේ (Mass tourism) ඉතිහාසය

2. පුරාණ දකුණු ආසියාව සහ සංචාරකයන්ගේ වාර්තා

********************************